**2022 පෙබරවාරි මස මාසික සභා රැස්වීමේ සංෂිප්ත වාර්තාව**

**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.02.23**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | චතුමිණි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා

අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ පෙබරවාරි මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.01.24 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.01.24 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.01.24 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට අදාළ අධිහාර සම්බන්ධ විස්තර ආකෘති පත්‍ර ප්‍රකාරය යොමු කර ඇති බැවින්, එහි වර්තමාන තත්ත්වය පිළිබඳ දන්වා එවන ලෙසට දකුණු පළාත්, ප්‍රධාන ලේකම්ගේ අංක CSS/12/4/874 හා 2022.01.31 දිනැති ලිපිය මගින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

- **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>මෙකී ලේඛනයේ අධිහාර ගෙවීමට සඳහන් කර ඇති පුද්ගලයින් මේ වන විට මිය ගොස් ඇත. එලෙසට අධිහාරයට ලක් වූ මුදලක් සභාව විසින් ගෙවිය නොහැකි බැවින්, මේ සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර යැවීමට තීරණය විය. එසේම මේ සම්බන්ධයෙන් සියලුම දෙනා දැනුවත් කිරීම සඳහා මෙම ලිපිය මහා සභාවට ඉදිරිපත් කළ බවත් ප්‍රකාශ කරන ලදී.</u>

II. දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ 2022.01.31 වන දින පැවැත්වූ සංගීත ප්‍රසංගය වෙනුවෙන් ඇප තැන්පත් ලෙස සභාවේ තැන්පත් කරන ලද රු. 50,000.00 ක මුදල නිදහස් කර දෙන ලෙස තිස්සමහාරාම, දෙබරවැව, රෙගී සවුන්ඩ් හි ආරියවංශ පතිනායක මහතා විසින් ඉල්ලීම් කර ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

- **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>මෙකී ආයතනය විසින් පසුගිය දිනක පවත්වනු ලැබූ සංගීත ප්‍රසංගය නිසා, අප විසින් ලබා දී තිබූ ලිපියේ කොන්දේසි කඩ කරමින්, දෙබරවැව පොදු ක්‍රීඩාගනයට හානි සිදු වී ඇති බවත්, එසේ සිදු වූ හානිය සඳහා අප ආයතනයේ තාක්ෂණ සේවා නිලධාරී විසින් රු. 50,000.00 ක ඇස්තමේන්තු වාර්තාවක් ලබා දී ඇති බැවින්, මේ සඳහා තැන්පත් කළ ආරක්ෂිත ඇප තැන්පතුව නිදහස් කළ නොහැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

✓ මේ පිළිබඳව නිවැරදි තොරතුරු දැන ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභාව අවස්ථාව සඳහා කැඳවූ තාක්ෂණ සේවා නිලධාරී විසින් ප්‍රකාශ කරන ලද්දේ, අප විසින් මෙකී සංගීත ප්‍රසංගය පැවැත්වීම සඳහා අවසර ලබා දුන් ලිපියේ වළවල් හෑරීම සිදු නොකරන ලෙසට කොන්දේසියක් දමා තිබුණද, එය කඩ කර ක්‍රීඩාංගනය වටා වළවල් හාරා තිබූ බවත්, වාහන ඇතුල් කිරීම සිදු නොකරන ලෙසට දන්වා තිබුණද, ක්‍රීඩාංගනයට වාහන අතුල් කර, එම වාහනවල රෝද පාරවල් ක්‍රීඩාංගනයේ තිබීම නිසා ක්‍රීඩාංගනයට හානි සිදු වී ඇති බවත්, එකී හානිය වෙනුවෙන් රු. 50,000.00 ක ඇස්තමේන්තු වාර්තාවක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>

පවත්වනු ලැබූ සංගීග ප්‍රසංගය නිසා දෙබරවැව පොදු ක්‍රීඩාංගනයට යම් හානියක් සිදු වී ඇත්නම්, ක්‍රීඩාංගනය තිබූ තත්ත්වයට පත් කිරීමට යම් නඩත්තු කටයුත්තක් සිදු කර, ඒ සඳහා යන වැඩ නිම් වාර්තාව අනුව, සිදු වූ හානිය සඳහා මුදල් අය කර ගැනීම සුදුසු වන බවට ප්‍රකාශ කර සිටින ලදී.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ සිදු කරන ලද සංගීත ප්‍රසංගය මගින් ක්‍රීඩාපිටියට යම් හානියක් සිදු වී ඇති බැවින්, මෙම ක්‍රීඩාපිටිය නැවත නඩත්තු කර, එම නඩත්තුව සඳහා යන වැඩ නිම් වාර්තාව අනුව, ක්‍රීඩාංගනයේ සිදු වූ හානිය සඳහා මුදල් අය කර ගැනීමට තීරණය විය.</u>

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ සහ පී.කේ. ආරියසේන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

III. තාක්ෂණ සේවා නිලධාරී, එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය, ආදායම් පරීක්ෂක එස්.ඒ. අරුෂි ප්‍රසංගිකා මහත්මිය සහ විදුලි කාර්මික ශිල්පී, එල්.වයි.ඩී. අමල් මහතා, කේ.ආර්.ජී. වසන්ත කුමාර මහතා විසින් එම නිලධාරීන්ට සේවකයින්ට හිමි නිල ඇඳුම් දීමනාව වසර 04 ක් එනම්, 2018, 2019, 2020 සහ 2021 වර්ෂවල සිට නොලැබෙන බැවින්, එකී වසර 04 ට අදාළ නිල ඇඳුම් දීමනාව ද සමඟ නිල ඇඳුම් දීමනාව ලබා දෙන ලෙසට එම නිලධාරීන් දෙදෙනා සහ සේවක මහතුන් දෙදෙනා විසින් ඉල්ලීම් කර ඇති ලිපි ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

✓ මේ පිළිබඳව නිවැරදි තොරතුරු දැන ගැනීම සඳහා ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභාවේ අදහස් දැක්වූ ලේකම්තුමිය විසින් ප්‍රකාශ කරන ලද්දේ, මීට වසර 04 කට පෙර පළාත් පාලන කොමසාරිස් විසින් ලිපියක් මගින් දන්වා ඇත්තේ තාක්ෂණ සේවා කාන්තා නිලධාරී, ආදායම් පරීක්ෂක කාන්තා නිලධාරීන් සහ විදුලි කාර්මික ශිල්පීන් හට නිල ඇඳුම් ලබා දීමේ ගැටළුවක් පවතින නිසා, මෙකී දීමනාව නැවත දැනුම් දෙන තුරු ලබා දීම තාවකාලිකව නවතා ඇති බවයි. නමුත් මෙලෙස ගැටළුවක් තිබුණත් අනෙක් පළාත් පාලන ආයතනවල මෙකී නිල ඇඳුම් දීමනාව ලබා දෙන නිසා, අප ආයතනයේ ඉහත නිලධාරීන්ද මෙම දීමනාව ඉල්ලුම් කරන බව ප්‍රකාශ කරන ලදී.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>තාක්ෂණ සේවා කාන්තා නිලධාරී, ආදායම් පරීක්ෂක කාන්තා නිලධාරීන් සහ විදුලි කාර්මික ශිල්පීන් සඳහා නිල ඇඳුම් දීමනාව ලබා නොදීමට පළාත් පාලන කොමසාරිස් විසින් ලිපියක් මගින්ම දැනුම් දී ඇත්නම්, ඒ සඳහා අපට සභා තීරණයක් ගත නොහැක. එම නිසා මේ සම්බන්ධයෙන් ප්‍රථමයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු වන බව දන්වා සිටින ලදී.</u>

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාව සභාවක් බවට පත් විය.

IV. විදුලි කාර්මික ශිල්පී එල්.වයි.ඩී. අමල් මහතා, කේ.ආර්.ජී. වසන්ත කුමාර මහතා විසින් පහත සඳහන් ආරක්ෂිත උපකරණ ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

- ස්ටැන්ලි වර්ගයේ අගල් 08 කටර් අඬු - 01
- ස්ටැන්ලි වර්ගයේ අගල් 06 කටර් අඬු - 01
- ආරක්ෂිත බූට් සපත්තු 10 - 01
- ආරක්ෂිත බූට් සපත්තු 06 - 01
- ඔරෝල මැසීම සඳහා රෙදි යාර - 08
- ෆයිබර් වර්ගයේ අඩි 11 x 11 ඉණිමන් - 01

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>විදුලි කාර්මික ශිල්පීන් සඳහා ද නිල ඇඳුම් දීමනාව ලබා දෙන ලෙසට මෙම වසර තුළ අනුමැතිය ලබා දුන්හොත්, මෙකී ඉල්ලීමෙහි සඳහන් ඔරෝල මැසීම සඳහා රෙදි මෙම වසරේ මෙම සේවකයින්ට ලබා දිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.</u>

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. දේශීය විදේශීය සංචාරකයින්ගේ පහසුව සඳහා තිස්සමහාරාම වැව් කණ්ඩිය අසල දැන්වීම් පුවරු සකස් කිරීම සහ කසළ බඳුන් සකස් කිරීම සඳහා සකස් කළ රු. 981,530.00 කින් යුතු ඇස්තමේන්තුව පිළිගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉදිරියේදී සෑම වැව් කණ්ඩියක් සඳහා ද මෙලෙස දැන්වීම් පුවරු හා කසළ බඳුන් ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත්, ඒ සෑම කාර්යයක්ම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපල මගින් සිදු කිරීමටත් තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

02. ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් සඳහා කරන ලද රු. 50,000.00 ට වඩා වැඩි වැය කිරීම් සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් වූ පහත උපලේඛනයේ සඳහන් බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

<u>උප ලේඛනය</u>

**රු. 50,000.00 ඉක්මවන ගෙවීම් විස්තරය**

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| I | කාර්යාලයට සෞඛ්‍ය උපකරණ මිලදී ගැනීම (ලයිබෝයි, ප්ලාස්ටික් කොහු, මොප්, මොප් බාස්කට්, මකුණු දැල් කඩන බ්‍රෂ්, කොසු) | රණසිංහ හැන්ඩි ක්‍රාෆ්ට් | 3011 2022.02.07 | 88,230.00 |
| II | කාර්යාලයට අවශ්‍ය සෞඛ්‍ය උපකරණ උපකරණ මිලදී ගැනීම (හැන්ඩ් වොෂ්, සෙනිටයිසර්, ටයිල් ක්ලීනර්, බූට්ස්, ප්ලාස්ටික් පනිට්ටු, 1 ½ ටේප් සීල්, 1'' ටේප් සීල්) | විනෝ ට්‍රේඩ් සෙන්ටර් | 591 2022.02.02 | 72,950.00 |
| III | T 2305 Toner (Original) 05 ක් මිලදී ගැනීම | PC Globe System (Pvt) Ltd | 03316 2022.01.25 | 65,000.00 |
| IV | කාර්යාලයේ ගබඩාව සඳහා mq-5949A Toner 02, 278 Toner 10, 285A Toner 20 මිලදී ගැනීම | ASSIST TECHNOLOGY SOLUTIONS | 10959 2022.02.03 | 63,500.00 |
| V | කාර්යාලයට විදුලි උපකරණ මිලදී ගැනීම | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | 1018 2022.02.11 | 217,050.00 |
| VI | තිස්සමහාරාම ආයුර්වේදය සඳහා ඖෂධ මිලදී ගැනීම | ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව | 71CR01229 2022.02.03 | 150,000.00 |
| VII | යෝධකණ්ඩිය ආයුර්වේදය සඳහා ඖෂධ මිලදී ගැනීම | ශ්‍රී ලංකා ඖෂධ නීතිගත සංස්ථාව | 71CR01230 2022.02.03 | 150,000.00 |
| VIII | මෝටර් ග්‍රේඩරයේ රේඩියේටරය අසල ඇති වෝටර් පැන් එක හා සම්බන්ධ ඇති රෝදය ලියවීම | BINARA GEAR WHEELMART Homagama | 846 2022.02.08 | 55,000.00 |
| IX | කාර්යාලයේ ගබඩාව සඳහා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | සීමාසහිත ගුණවර්ධන සහ පුද්ගලික සමාගම | 37012, 37013 2022.01.24 | 282,780.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. පරිසර පොදු පහසුකම් කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් හිටපු මොණරාගල ප්‍රාදේශීය ලේකම්, දිසාපති තනතුර දැරූ පද්මා කුලකුලසූරිය මහත්මිය පරිසර පොදු පහසුකම් කාරක සභාව සඳහා සම්බන්ධ කර ගැනීමට 2022.02.07 දින පැවැති පරිසර පොදු පහසුකම් කාරක සභාවේදී සාකච්ඡා වූ බැවින්, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, ගරු උප සභාපති හා ගරු ප්‍රාදේශීය සභා සභික මහත්ම මහත්මීන්ට 2022 වර්ෂය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය පහත පරිදි ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ද්‍රව්‍යයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 01 | A4 බන්ඩල් | 01 |

| | | |
|---|---|---|
| 02 | හාප්ෂීට් බන්ඩල් | 01 |
| 03 | ෆයිල් කවර | 12 |
| 04 | කාබන් පෑන් | 06 |
| 05 | ස්ටෙප්ලර් පැකට් | 01 |
| 06 | 9x4 ලිපි කවර | 50 |
| 07 | 6x3 ලිපි කවර | 50 |
| 08 | කාබන් කොළ - තනි පිට | 10 |
| 09 | ෆයිල් ටැග්ස් | 24 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. රට තුළ වූ කොවිඩ්-19 හෙවත් නව කොරෝනා වෛරසය හේතුවෙන් සංචරණ සීමා පැනවීම නිසා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමර සඳහා ලැබිය යුතු කඩ කුලී හා ප්‍රමාද ගාස්තු සඳහා සහනයක් ලබා දීමට 2021.05.17 දින පැවැති මහා සභා වාර්තාවේ අංක 06 යටතේ සභා සම්මත වී ඇත. 2021 මැයි මස 01 දින සිට ජුනි මස 30 දක්වා ගරු ආන්ඩුකාරතුමා ලබා දී ඇති උක්ත සහනය නැවතත් ලබා දීම සුදුසු බව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 12 දරණ පළාත් සභා විධිවිධාන පනතේ 2(1) බ(අ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.09.13 දින අනුමත කර ඇති ලිපිය අනුව, ප්‍රාදේශීය සභාවට අය විය යුතු මුදල් අත් හැරීම යටතේ 2021 මැයි, ජුනි, සැප්තැම්බර් මාසවල කපා හරින ලද ආදායම් මුදල් සම්බන්ධ විස්තරය මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කඩ කාමරය පිහිටි ස්ථානය | මැයි මස කපා හරින ලද ආදායම (රු) | ජුනි මස කපා හරින ලද ආදායම (රු) | සැප්තැම්බර් මස කපා හරින ලද ආදායම (රු) | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ ඉදිරිපිට කඩ කාමර | 21,250.00 | 21,250.00 | 21,250.00 | **63,750.00** |
| 2 | අකුරුගොඩ කඩ කාමර | 14,000.00 | 14,000.00 | 14,000.00 | **42,000.00** |
| | **එකතුව** | | | | **105,750.00** |
| 3 | තිස්සමහාරාම නව වෙළඳ සංකීර්ණයේ වැරදියට සටහන් වූ බදු මුදල නිවැරදි කිරීම | 7,400.00 | 7,400.00,400 | 7,400.00 | **22,200.00** |
| | **කපා හැරීමට යෝජිත මුදල (105,750.00 – 22,200.00 = 83,550.00)** | | | | **83,550.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

06. දේශීය විදේශීය සංචාරකයින්ගේ පහසුව සඳහා තිස්සමහාරාම වැව් කණ්ඩිය අසල දැන්වීම් පුවරු සකස් කිරීම සහ කසල බඳුන් සකස් කිරීම සඳහා පහත සඳහන් සංශෝධිත ද්‍රව්‍ය ලයිස්තුව මිල ගණන් කැඳවා මිලදී ගෙන, එකී කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| 01.1 ½ විශ්කම්භය සහිත GI බට (1.8mm thick,heavy quality) | - 60.0 NR |
| 02. 2.5 mm ඝනකම් GI Sheet (8X4 size) | - 1.0 NR |
| 03.1 m පට්ටම් | - 500.0 FT |
| 04.Anticorrosive paint | - 4.0L |
| 05.Enamel Paint (Green) | - 4.0 L` |
| 06. Thinner | - 8.0L |
| 07 2 Brush | - 2.0NR |
| 08.බැරල් | - 40.0 NR |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජ්. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, වාරිමාර්ග ගරු අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය හා ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ විමධ්‍යගත ප්‍රතිපාදන මුදලින් රු.103000.00 ක මුදලක් තිස්සමහාරාම බල ප්‍රදේශයේ මාගම අක්කර 20 මාර්ගයේ බෝක්කුව සකස් කිරීම (ප්‍රජා දායකත්වය සමඟ) සඳහා වෙන් කර ඇති අතර ඊට අදාළ ඇස්තමේන්තුව මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටසිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

ඉහත වැඩසටහන සඳහා ප්‍රතිපාදන ලැබී ඇතිමුත්, එය මේ වන තෙක් ආරම්භ කිරීමට නොහැකි වුයේ මෙකී බෝක්කුව ඇලක් හරහා සකස් වී ඇති නිසාවෙන් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම අපහසු බැවින්ය. එම නිසා ඉදිරියේදී ඇලෙහි ජලය නතර කළ පසු මෙය සකස් කළ හැකි බැවින්, මෙම ඉදිකිරීම මාර්තු මස මුල ආරම්භ කිරීමට හැකියාව ඇත්දැයි විමසන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>මෙම ව්‍යාපෘතිය නිරීක්ෂණය සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන් ද පැමිණෙන බැවින්, මේ සතිය තුළම එහි වැඩ ආරම්භ කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. 2021.12.31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2022.02.21 දිනට අවසන් කර වාර්තා ගත කර ඇති අතර, එය පිළිගෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ කඩ කාමරය | 09 | ආරියවංශ පුංචිහේවා | කුසුමාවතී අබේනායක | ස්වාමියාගෙන් බිරිඳට |
| 2 | තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩ බක්කිය | 41 | පටබැඳි මද්දුමගේ රුවිනි | තුඹේගමගේ කල්පනී සෙව්වන්දි | එක්වන් මුදල ගෙවා |
| 3 | දෙබරවැව දියවර ගොඩනැඟිල්ල නව කඩ කාමරය | 21 | හේමදාස වර්ණකුලසූරිය | කරුණාවතී රාජපක්ෂ | ස්වාමියාගෙන් බිරිඳට |
| 4 | තිස්සමහාරාම නව වෙළඳ සංකීර්ණයේ දෙමහල් ගොඩනැඟිල්ලේ කඩ කාමරය | 09 | සරත් මහින්ද උයන්හේවා | හර්ෂණී සමන්මලී විජය වර්ධන | ස්වාමියාගෙන් බිරිඳට |
| 5 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ ඉදිරිපිට නව කඩ කාමරය | 01 D | හික්කඩුව ගලප්පත්තිගේ සුමතිපාල | රම්‍යා ලාලනී සමරවීර | ස්වාමියාගෙන් බිරිඳට |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. දෙබරවැව ජාතික පාසල ඉදිරිපිට සකස් කළ මඟී ආවරණ අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම සඳහා දකුණු පළාත් මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරිය විසින් 10% ක මුදල් රඳවා ගෙන එවන ලද රු. 102,636.00 ක් වටිනා අංක 450042 දරණ චෙක්පත අප වෙත ලැබී ඇති අතර, කොන්ත්‍රාත් ආයතනය වන බී.සී. 02 රුහුණු ගොවි සංවිධානය වෙත ගෙවීම් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. ZB-0413 අංක දරණ කම්පැක්ටර් රථය සඳහා 900x20 ප්‍රමාණයේ ටයර් 04 ක්, ටියුබ් 04, රිම්ටේප් 04 ක් මිලදී ගෙන ලබා දීම සුදුසු මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. සභාව සතු රථවාහන සඳහා DS 40 ඔයිල් ලීටර් 210 ක බැරලයක් මිලදී ගැනීම වෙනුවෙන් තිස්සමහාරාම සුපුන් ඔයිල් මාර්ට් ආයතනය වෙත ගෙවීමට ඇති රු. 133,000.00 ක මුදල ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා**

- **ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය**

13. සඳුන්ගම පාරේ රේන් ට්‍රී හෝටලය ඉදිරිපිට මාර්ගය හා එකමුතුගම අඩි 100 මාර්ගය ගිලා බැස ඇති බැවින්, මෙකී මාර්ග සංවර්ධනය කර දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ඉහතින් සඳහන් කරන ලද සඳුන්ගම රේන් ට්‍රී හෝටලය ඉදිරිපිට මාර්ගය සහ දෙබරවැව ජාතික පාසල ඉදිරිපිට මාර්ගය පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට කටයුතු කරන ලෙසට එකී ආයතනය වෙත දන්වා යැවිය යුතුය. කිලෝ මීටර් 100,000 වැඩසටහන යටතේ සකස් කරන ලද

මාර්ග නඩත්තු කිරීම සඳහා, වෙනමම නඩත්තු ඒකකයක් සකස් කර ගත යුතු බවට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත දන්වා යැවීම සුදුසු බවට තීරණය විය. එතෙක් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයා සමඟ සාකච්ඡා කර, මේ සඳහා කෙටි විසඳුමක් ලබා ගත යුතු බවත් දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

14. අංජලිගල පළමු පටුගම පාරේ ඉදිකිරීමට නියමිත බෝක්කුව ඉදි නොකිරීම නිසා, වැසි කාලයේ දීජනතාව දැඩි අපහසුතාවයට පත් වන බැවින්, එම බෝක්කුව සකස් කර දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

මෙකී කරුණ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත දන්වා යැවීමට තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.02.07 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.02.07 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.02.07 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.02.07 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (උ෧) වෙනත් කරුණු

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ අදහස් දැක්වීම**

තිස්සමහාරාම අලුත්ගොඩ මාර්ගය අවුරුදු 03 තිස්සේ සංවර්ධනය කරමින් පවතී. මෙතෙක් කාලයක් තුළ මෙම මාර්ගයේ වැඩ නිම නොකිරීම නිසා ජනතාවට දැඩි අපහසුතාවයකට පත් වී සිටී. එම නිසා මෙකී මාර්ගයේ සංවර්ධන කටයුතු ප්‍රමාද වීම බොහෝ කලක් තිස්සේ සිදු වන බවත්, කඩිනමින් සංවර්ධන කටයුතු නිම කරන ලෙසටත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීම සුදුසු බවට දන්වා සිටින ලදී. එසේම තිස්සමහාරාමයේ බොහෝ ජනතාවක් පසෙහි ස්වභාවය නිසා හතිය, ඇදුම වැනි රෝගවලින් පෙලේ. මාර්ගය සකස් කිරීමේ කටයුතු නිම නොවීම නිසා එමගින් සිදුවන දූවිලි තත්ත්වය මත, ජනතාවගේ මෙකී රෝග තත්ත්වයන් වැඩි වීමේ අවධානමක්ද මතුව ඇති බව වැඩි දුරටත් සඳහන් කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

හම්බන්තොට මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුතුමා වෙත තිස්සමහාරාම අලුත්ගොඩ මාර්ගයේ සංවර්ධන කටයුතු ප්‍රමාද වන බවත්, මෙකී කටයුතු කඩිනමින් නිම කරන ලෙසටත් ලිපියක් මගින් දන්වා යැවීමට තීරණය විය. එකී ලිපියට අංජලිගල පන්සලට පිවිසෙන මාර්ගයේ ද වැඩ කඩිනමින් නිම කර දෙන ලෙසට දන්වා යවන ලෙසටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම**

පසුගිය කාලයන්හි ග්‍රාමීය හා යටිතල පහසුකම් අමාත්‍යාංශය භාරව සිටි ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් 2002.11.24 වන දින සුබෝධාරාමය පන්සල ඉදිරිපිට ගිමන් හලක් සකස් කළ බවත්, එම ස්ථානයේ මේ වන විට ගරාජයක් පවත්වාගෙන යන බැවින්, එය පවත්වාගෙන යාම සඳහා අවසරය සභාවෙන් ලබා දී ඇත්ද යන්න විමසීම් කරන ලදී.

❖ **ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ඉහත ස්ථානයේ තිබෙන ගරා වැටී ඇති ගොඩනැගිලි ප්‍රයෝජනයට නොගැනීම නිසා විවිධ අපචාර ක්‍රියා සිදු වන බැවින්, මෙකී ගොඩනැගිලි ප්‍රාදේශීය ලේකම් විසින් සභාවට පවරා ඇති බැවින්, එම ගොඩනැගිලි තක්සේරු කර බදු අය කිරීමේ පදනම මත, ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී. එසේම එම කඩ කාමර සඳහා ඔවුන්ගේ නමින් විදුලිය ලබා ගැනීමට ද අවසර ලබා දුන් බවත්, මෙම කඩ කාමරවලට අමතරව, කිසිදු ඉදිකිරීමක් සිදු නොකරන ලෙසටද ඔවුන් වෙත දන්වන ලදී. තවද, යම් අවස්ථාවකදී මෙකී ගොඩනැගිලි ඉවත් කළහොත්, ඔවුන් පෙර ව්‍යාපාර කටයුතු නවතා එම ස්ථානයන් නැවත පවරා ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම කඩ කාමර බදු අයිතිය මත ලබා දෙන්නේ නම්, දීර්ඝ කාලීන අයිතියක් ලබා ගැනීමට නොහැකි වන පරිදි, යම් කාල සීමාවකට ලබා දිය යුතු බව දන්වා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම**

ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මියගේ මවගේ අවමංගලා උත්සවය සඳහා සහභාගී වීමට නොහැකි වීම පිළිබඳ කණගාටු වන බවත්, එම මැණියන්ට අපගේ ශෝකය ප්‍රකාශ කරන බවත් දන්වා සිටින ලදී. තවද, මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් සභාව මගින් දුරකතනයෙන් හෝ අපව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාවට සම්බන්ධ යම් සිදුවීමක් සිදුවුවහොත්, ඒ සම්බන්ධයෙන් සියලුම ගරු සභිකයින්ට දැන්වීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

<u>ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මියගේ මවගේ අභාවයට සභාව වෙනුවෙන් අප සියලුම දෙනාගේ ශෝකය ප්‍රකාශ කරන ලදී. එම මැණියන්ට උතුම් වූ නිවන් මග අත්වේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, රටට උගතුන්, ගුරුවරුන් බිහි කළ එම උතුම් මැණියන්ට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරන ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මියගේ අදහස් දැක්වීම</u>

අප මෙම පාලන කාලය තුළ කාන්තා නියෝජිතයින් ලෙස පත් වී සිටියද, මේ වන විට අපගේ ධූර කාලයේ අවසන් භාගය ගත වෙමින් පවතී. එම නිසා අප පාලන කාලය තුළ කාන්තා හා ළමා හිංසනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ඉදිරියේ කටයුතු කිරීම සුදුසුය. ගම්මානවල බොහෝ කාන්තාවන් පිරිමින්ගේ තාඩන පීඩනවලට ලක් වී දැඩි පීඩනයකට පත්ව ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක මේ වසර තුළ සිදු කිරීමට කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

අප ප්‍රදේශයේ ද ළමා අපචාර, අපයෝජන දිගින් දිගටම වැඩි වෙමින් පවතී. ගැහැණු පිරිමි භේදයකින් තොරව මෙවැනි සිදුවීම් සිදු වේ. කාන්තා නියෝජිතයෙක් ලෙස මා ඉල්ලා සිටින්නේ මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් දැනුවත් වීමේ වැඩසටහන් කොට්ඨාස 13 හිම ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසා දෙන ලෙසයි.

විදුලි ක්පපාදු කිරීම මේ දිනවල සිදු කිරීම නිසා ජනතාවට මහත් ගැටළුකාරී තත්ත්වයක් වී ඇත. එම නිසා විදුලිය කප්පාදු කරන වේලාව කල් ඇතිව ජනතාව වෙත දැනුම් දිය හැකි නම් දෛනික වැඩ සැලසුම් කර ගත හැකි බැවින්, මේ සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ඩෙංගු රෝගය රට පුරාම ව්‍යාප්ත වන කාලයක් ලෙස මේ දිනවල අප ප්‍රදේශයේ ද ඩෙංගු රෝගය ව්‍යාප්ති වීම වැළැක්වීම සඳහා ශ්‍රමදාන වැඩසටහන් සිදු කරන ලදී. එසේ සිදු කිරීමේදී ඒකරාශී කරන ලද බෝතල්, ටිං ආදී ද්‍රව්‍ය ගම්මානවල එක් එක් ස්ථානවල එකතු කර තබා ඇති බැවින්, මේවා ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය තටයුතු සලසා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මේ වන විට රට යථා තත්ත්වයට පත්වෙමින් තිබෙන නිසා, ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත දන්වා ප්‍රජා කමිටු හරහා කොට්ඨාස 13 හිම කාන්තා හා ළමා හිංසනය පිළිබඳ වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. එකී වැඩසටහන් සඳහා ප්‍රජා පොලිස් ඒකකයේ නිලධාරීන්, ග්‍රාම නිලධාරී සම්බන්ධ කර ගැනීමට කටයුතු කටයුතු කරන ලෙසටත්, මෙම වැඩසටහන් 13 සංවිධානය කිරීමට කටයුතු කරන ලෙසට ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී. මේ සම්බන්ධ වෙනත් පළාත් පාලන ආයතනවල වැඩසටහන්වලට සහභාගී වී දේශනද තමා පවත්වා ඇත. එම නිසා මේ සඳහා සම්පත් දායකයින් සම්බන්ධ කර ගැනීම වෙනුවෙට කාන්තා පොලිස් නිලධාරීන්, ග්‍රම නිලධාරින් සම්බන්ධ කර ගනිමින් දනුවත් කිරීමක් සිදු කළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.</u>

<u>මෙවැනි සිදුවීම් නිසා හිංසනයට ලක් වන්නේ කාන්තාවන් පමණක් නොවේ. පිරිමින් හටද කාන්තාවන්ගේ හිංසා සිදු වනු ඇත. එම නිසා මෙවැනි දේශන සිදු කිරීමේදී ඒ සඳහා කාන්තා පිරිමි</u>

දෙපක්ෂයම සම්බන්ධ කර ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී. එසේම මෙම වැඩසටහන් සඳහා ගෞරවණීය ස්වාමීන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම වඩාත් සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ ඩීසල්/ ගල් අඟුරු නිෂ්පාදනය සිදු නොවන නිසා, විදුලි අර්බුධයන්වලට මුහුණ දීමට සිදු වී ඇත. මෙවැනි තත්ත්වය කුමන ආණ්ඩුවක බලය පැවතිය ද සිදු විය හැකිය. විදුලි කප්පාදු කිරීම සම්බන්ධව කල් ඇතිව ජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට අතිගරු ජනාධිපතිතුමාටත්, දිස්ත්‍රික් ලේකම්තුමාටත් ලිඛිතව දන්වා යැවීමට තීරණය විය.

ශ්‍රමදාන වැඩසටහන් සිදු කර, ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කළ පසුව බෝතල්. ටිං ආදී ද්‍රව්‍ය ගම්මානවල ඒකාරාශි කර තිබූ පසුව. ඒවා ඉවත් කිරීමට කටයුතු සිදු කළත්, දැනට එම කාර්යය එසේ සිදු කිරීම මත මෙලෙසට ඒවැනි බෝතල්, ටිං ආදී ද්‍රව්‍ය නැවතත් එකතු වී ඇත. මෙකී ක්‍රියාවලිය සිදු කිරීම සඳහා කොට්ඨාසයකට ශ්‍රමදාන වැඩසටහන් සිදු කිරීම සඳහා දින 02 ක් ලබා දීමටත්, ඉන් පසුව කොට්ඨාසයේ එකතු වන බෝතල්, ටිං ආදී ද්‍රව්‍ය ඉවත් කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

✓ මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ සහ පී.කේ. ආරියසේන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

දෙබරවැව ප්‍රදේශයේ එකතු වී ඇති බෝතල්. ටිං ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කළ බවත්, ඉදිරියේ ගැමුණුපුර, විජිතපුර ප්‍රදේශවල එකී අපද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කරන බවත් පරිසර විෂය නිලධාරී, ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මහත්මිය ප්‍රකාශ කරන ලදී.

කාරක සභා අවස්ථාව සඳහා කැඳවූ ප්‍රජා සංවර්ධන නිලධාරී, එච්.එම්. කාංචනා සංජීවනී මහත්මියට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලද්දේ කාන්තා හා ළමා හිංසනය වැළැක්වීම සම්බන්ධයෙන් වූ වැඩසටහන් කොට්ඨාස 13 හිම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසයි. මෙකී වැඩසටහන් සඳහා ප්‍රජා පොලිස් ඒකකයේ නිලධාරීන්, පොලිස් කාන්තා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්තුමිය, ග්‍රාම නිලධාරීන් ද එකී වැඩසටහන සඳහා සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන ලෙසට එතුමියට තව දුරටත් උපදෙස් ලබා දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව එක්ව පසුගිය දිනවල ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එම දිනයන්වලදී එකතු කරන ලද බෝතල්, ටිං ආදී ද්‍රව්‍ය එකතු වී ඇති ප්‍රදේශයන්වලින් ඉවත් කිරීම, ලබන මහා සභා දිනට පෙර සිදු කරන ලෙසටත් පරිසර විෂය නිලධාරීට උපදෙස් ලබා දෙන ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ සහ ගරු සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

❖ ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතාගේ අදහස් දැක්වීම

කාපට් දමා සංවර්ධනය කරන ලද මාර්ගයක් වන නැදිගම්විල බෝධිය අසල මාර්ගය කාපට් දැමීම සඳහා ඒ.බී.සී. ගල් දමා ඇත. මෙකී මාර්ගයේ කාපට් දැමීම ප්‍රමාද වන නිසා, එකී ගල් දෙපසට විසිරී යාමක් සිදු වේ. එම නිසා මෙකී කරුණ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

රබර්වත්ත සච්සිරි හාල් මෝල අසලින් ජයසිරි මාවතට යන මාර්ගය ගිලා බැසීමක් සිදු වී ඇති බැවින්, මෙය නඩත්තු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

නැදිගම්විල විහාරයට යන කාපට් මාර්ගයට මේ වන විට දැඩි හානි සිදු වී ඇත. එම නිසා මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

රබර්වත්ත ජයසිරි මුදලාලිගේ ඉඩම පිටුපස පවතින ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා දී ඇති ඉඩමකි. මෙම ඉඩමේ මේ වන විට ඉදිකිරීමක් සිදු කරන බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>නැදිගම්විල විහාරයට යන කාපට් මාර්ගය බොහෝ කලක සිට තිබෙන කාණුවක බැම්මක් බැඳීම නිසා, මාර්ගය ගිලා බැස ඇති බවත්, එම ස්ථානය අසල අනවසර ඉදිකිරීමක් ද සිදු කර ඇති බැවින්, ඒ සම්බන්ධව නීතිමය කටයුතු සිදු කළ යුතු බවත් දන්වා සිටින ලදී.</u>

<u>රබර්වත්ත සච්සිරි හාල් මෝල අසලින් ජයසිරි මාවතට යන මාර්ගය සහ ගරු සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ඉදිරිපත් කරන ලද ආදාහනාගාරය අසල මාර්ගය කර්මාන්ත කමිටුව හරහා සභාවේ සෘජු ශ්‍රමික පදනම මත සකස් කිරීමට තීරණය විය.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම</u>

පසුගිය දිනක අපවත්වී වදාළ උද්ධකන්දර නායක ස්වාමීන්වහන්සේගේ තුන්මස් පිංකම වෙනුවෙන් 2022.03.02 වන දින පිරිත් දේශනයක් සහ 2022.03.23 වන දින දානමය පිංකම් පැවැත්වීමට කටයුතු පිළියෙල කර ඇති බවත්, දින 07 ක් පුරා බෝධි පූජාමය පිංකම් මාලාවක් සංවිධානය කර ඇති බැවින්, එම පිංකම් සියල්ල සඳහා සහභාගී වන ලෙසට ඉල්ලා සිටින ලදී.

වසම් 44 හිම විථි පහන් පාන්දර වන විට නිමා දැම්මක් සිදු නොවන නිසා, පාන්දර වන විට විථි පහන් නිමා දැමීම සිදු කරන ලෙසටත්, සවස් කාලයේ අඳුර පැවතිය පසුව, විථි පහන් දැමීමට කටයුතු කරන ලෙසටත් ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රචාරනයක් සිදු කිරීම සුදුසු වේ.

විහාරමහාදේවීපුර වසමේ එක් ගම්මානයක පොළ සඳහා වෙන් කර ඇති භූමිය යම් පුද්ගලයෙකු විසින් කොටු කර වැට ගසා ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මාර්ගයන්හි පවතින විථි පහන් නිමා දැමීම කටයුතු පාන්දර 04.00 සිට සිදු කිරීම සඳහා සභාවේ මුර සේවයේ යොදවා සිටි, එච්.කේ. නලීන් රන්දික මහතා මේ වන විට සේවයේ යොදවා ඇති බව සඳහන් කරන ලදී.</u>

<u>තවද, ඉදිරියේ දී ප්‍රධාන මාර්ගයන්හි පවතින විථි පහන් ස්වයංක්‍රීයව නිවෙන ලෙසට සහ පාන්දර විථි පහන් ස්වයංක්‍රීයව දැල්වෙන ආකාරයට, ස්වයංක්‍රීය ස්විච් භාවිතා කිරීමට ද කටයුතු සැලසුම් කර ඇති බව දන්වා සිටින ලදී.</u>

<u>සුදුවැලිපැලැස්ස පොළ භූමිය සභාවට පවරා දීමක් සම්බන්ධයෙන් කිසිදු ලිඛිත ලියවිල්ලක් අප ආයතනය වෙත ලබා දී නොමැති බව දිස්ත්‍රික් ලේකම්තුමා විසින් ප්‍රකාශ කරන ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා</u>

යම් භූමියක සභාවට සතු ගොඩනැගිල්ලක් ඉදි කරන්නේ නම්, එම භූමිය සභාව සතු වනු ඇත. පොළ පැවැත්වීම, බදු අය කිරීම සභාව විසින් සිදු කරන්නේ නම්, එම ගොඩනැගිල්ල සභාව සතු වත්කමකි.

රජයේ ප්‍රතිපාදන ලබා ගනිමින්, සකස් කරන ලද ගොඩනැගිල්ලක් මෙම භූමියේ පවතින බවත්, නිසා මෙලෙස සභාව සතු ගොඩනැගිල්ල නැවත සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

✓ සුදුවැලිපැලැස්ස පොළ භූමිය සම්බන්ධයෙන් ගරු සභික, පී.කේ. ආරියසේන මහතා මීට පෙර මහා සභාවකට ඉදිරිපත් කරන ලද යෝජනාව නැවත සිහිපත් කර ගැනීම සඳහා ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

ලේකම්තුමිය විසින් ගරු සභික, පී.කේ. ආරියසේන මහතා විසින් මීට පෙර මහා සභාවක් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව නැවත සිහිපත් කර ගැනීම සඳහා සභා ගත කරන ලදී.

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>

වනජීවී දෙපාර්තමේන්තුව විසින් වන අලින් විදුලි වැටෙන් එපිටට පලවා දැමීම සඳහා කටයුතු සිදු කරන බවට දන්වා ඇති බැවින්, ගරු සභාපතිතුමාගේ මැදිහත්වීම මත, මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා එම නිලධාරීන් සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

වන අලින් ගම්වැදීම නිසා වන අලින්ට සිදුවන සත්ව හිංසාවට අකමැති යම් යම් ආයතන තිබුණද, එකී ආයතන එක් මොහොතකට හෝ මිනිසුන්ට වන අලින්ගෙන් සිදුව ඇති පීඩනය සම්බන්ධයෙන් නොසිතන බව ප්‍රකාශ කරන ලදී.

යෝධ වැව් රක්ෂිත ඇතුළුව සියලුම වාරිමාර්ග සහ සුළු වාරිමාර්ගයට අයත් වැව් රක්ෂිතවල භූමි ප්‍රමාණයන්ද අල්ලා යම් යම් පුද්ගලයින් විසින් ව්‍යාපාරිකයින්ට විකුණනු ලබයි. එබැවින් මෙකී කටයුතු වහාම නතර කරලීම සඳහා අදාළ ආයතනයන් දැනුවත් කර, වැව් සියල්ලෙහිම රක්ෂිත වෙන් කර ගැනීමට කටයුතු කළ යුතුය.

ගමේ ප්‍රජා පොලිස් ඒකකය ස්ථාපිත කිරීමට පෙර, එකී කටයුතු සිදු කරන ලද්දේ අප හා එක්ව ගමේ ජනතාවයි. නමුත් දැනට ප්‍රජා පොලිස් ඒකකය රැස්වී ගමේ කටයුතු සොයා බැලුවද, ඒ සඳහා ගරු සභිකයින් වන අපට කිසිදු දැනුම් දීමක් සිදු නොකර බවත්, මේ සම්බන්ධ ගැටළුවක් පවතින නිසා, ඉදිරියේදී ගරු සභිකයින් ද ඒ සඳහා සම්බන්ධ කර ගන්නා ලෙසට පොලිස් ස්ථානය දැනුවත් කරන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

මේ දිනවල සිදු වන විදුලි අර්බුදය විදුලි මාපියාව සමඟ සිදු වන දෙයකි. මේ දිනවල අප ප්‍රදේශයන්වලද සූර්ය පැනල සවි කිරීමේ කටයුතු සිදු කරනු ඇත. තාප විදුලි බලාගාරා ගැනීමේදී රටේ සියලුම ජනතාවට සූර්ය පැනල සවි කර ගත හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කිරීමත් ඉතා වැදගත් කාර්යයක් බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>වනජීවී දෙපාර්තමේන්තු පනත අනුව වන අලියකු ගම් වැදුණු පසුව, එම අලියා පළවා හැරීමට ඔවුන්ට කිසිදු බලයක් නොමැත. වන අලින් ගමට වැදුණු පසු, එම අලින් පළවා හැරීමට කටයුතු කිරීම තුළින් වනජීවින් ආරක්ෂා කරන නිලධාරීන්, වනජීවින්ට හිංසා කරන අය බවට පත් වේ. නමුත් මෙකී ගැටළුව පිළිබඳ ස්ථිරසාර විසඳුමක් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ද යෝජනා වූ පරිදි, වනජීවී දෙපාර්තමේන්තුවේ කතරගම, ලුණුගම්වෙහෙර අධ්‍යක්ෂකවරු, යාල උද්‍යාන භාරකරු, බුන්දල උද්‍යාන භාරකරු සහ මේ සම්බන්ධ අනෙකුත් ආයතන එකාබද්ධව රැස්වීමක් කඩිනමින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත්වීමට තීරණය විය. මෙහිදී යාල ජාතික වනෝද්‍යානයේ පවතින ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතු බවත් දන්වා සිටින ලදී.</u>

ඉදිරියේ දී ප්‍රජා පොලිස් ඒකකය රැස් වන විට කොට්ඨාසය භාර ගරු සභිකයින්ද ඒ සඳහා සම්බන්ධ කර ගන්නා ලෙසට තිස්සමහාරාම, වීරවිල, කිරින්ද යන පොලිස් ස්ථාන වෙත ලිපියක් මගින් දන්වා යැවීමට තීරණය විය.

අතිගරු ජනාධිපතිතුමා රටේ අඩු ආදායම්ලාභී පවුල්වලට සූර්ය පැනල සවි කිරීමේ වැඩසටහනක් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කර ඇති බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම**

පසුගිය දිනක තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, ගරු උප සභාපති ඇතුළු ගරු සභික මණ්ඩලයත්, කාර්ය මණ්ඩලයේ නිලධාරී/සේවක මහත්ම මහත්මීන් එක්ව සුහද ක්‍රිකට් තරඟාවලියක් පවත්වන ලදී. එම ක්‍රිකට් තරඟාවලිය සඳහ සම්බන්ධ වූ සියලුම දෙනාට ස්තූතිය පුද කරන අතර, එය අප සියලුම දෙනාට ලැබුණු හොඳ අවස්ථාවක් ලෙසත් මා දකින බව ප්‍රකාශ කරන ලදී. එසේම එම තරඟාවලියේ කටයුතු සිදු කර ගෙන යාම සඳහා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා දක්වන ලද නායකත්වයට සහ ලබා දුන් සහායට විශේෂයෙන් ස්තූතිය පුද කරන ලදී.

වැව් ආරක්ෂා කර ගැනීම සඳහා වැව් රක්ෂිත හරහා පාරක් ඉදි කර ඇත. මෙම පාරෙන් එපිට ජනතාව ගොවිතැන් කටයුතු කරන ලද ඉඩම් තිබේ. වැව් රක්ෂිත වෙන් කිරීම සඳහා මායිම් ලකුණු කරන්නේ නම්, ස්ථිරව ගොවිතැන් කටයුතු කරන ලද ඉඩම් ඒ සඳහා අත්පත් නොවන ආකාරයට වැව් රක්ෂිත වෙන් කර ගත යුතුය. එසේ වැව් රක්ෂිත වෙන් කිරමට කටයුතු සිදු කරන්නේ නම්, වැව් රක්ෂිත අසලින් ඇති මාර්ගය හරහා වැව් රක්ෂිත වෙන් කිරීමට කටයුතු සිදු කිරීම සුදුසු වන බවත්, එසේ සිදු නොවුනහොත්, ඉදිරියේ ලොකු ගැටළුවක් ඇති විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

කච්චේරියගම ග්‍රාම නිලධාරී වසමේ, විදුලි බල මණ්ඩලය විසින් ගස්වල අතු කපා පාරේ දමා ගොස් ඇත. තම කොට්ඨාසය සංචාරකයින් බහුලව ගැවසෙන ප්‍රදේශයකි. මෙසේ මාර්ගන්වල අතු ඉති දමා ගිය පසුව එම සාංචාරකයින් දැඩි අපහසුතාවය පත් වනු ඇත. එම නිසා මේ සඳහා යම් ක්‍රමවේදයක් සකස් කර ගන්නා ලෙසට විදුලි බල මණ්ඩලය දැනුවත් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

අයවැයෙන් වැඩ ලක්ෂයක් වැඩසටහන යටතේ අකුරුගොඩ උසාවිය ඉදිරිපිට බොජුන් හලක් හා නීතිඥ කුටි ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මුල් ගල් තැබීමේ කටයුතු පසුගිය දිනක සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය සාර්ථක ලෙස ආරම්භ කර හැකි ඉක්මණින් නිම කර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී. එසේම මෙම වැඩසටහන රට පුරාම සියලුම ග්‍රාම නිලධාරී වසම්වල ක්‍රියාත්මක වන කරන ලදී. ඉහත ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කර ලබා දීමට කටයුතු සිදු කළ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු මුදල් අමාත්‍යතුමා, ගරු වාරිමාර්ග අමාත්‍යතුමා, ගරු නාමල් රාජපක්ෂ අමාත්‍යතුමා ඇතුළු සියලුම දේශපාලන නායකයින් වෙත තම හෘදයාංගම ස්තූතිය පුද කරන ලදී.

යාල වනෝද්‍යානයේ පවතින ගැටළු විසඳා ගැනීම සඳහා මීට පෙර මහා සභාවන් කිහිපයකදී සහ කමිටු කිහිපයකදී කතා කළත් මෙතෙක් ඒ සඳහා කුමන හෝ ක්‍රියාමාර්ගයක් ගෙන එකී ගැටළු විසඳා ගැනීමට නොහැකි වී ඇත. යාල වනෝද්‍යාන භූමිය තුළ සංචාරක ජීප් රථ ගමන් කිරීමේදී වේගය අධික යැයි පවසා, ජීප් රථ මසක් වැනි කාලයක් තහනම් කිරීම සිදු කරනු ලබයි. තවද, සංචාරය කිරීම සඳහා වෙන් කර ඇති 12 – 02 නීතිය ක්‍රියාත්මක වීම සංචාරකයින් සේම ජීප් රථ හිමියන් ද දැඩි අපහසුතාවයට පත් වන නිසා යාල ජාතික වනෝද්‍යානයේ පවතින මෙකී ගැටළු විසඳාලීමට අදාළ ආයතනයන් දැනුවත් කරන ලෙසටත්, මෙකී කරුණ මෙසේ සාකච්ඡා කරන අවසන් අවස්ථාව ලෙසත් දන්වා සිටින ලදී.

ආදාහනාගාරය අසල මාර්ගය සහ කාවන්තිස්ස ලී බඩු වෙළඳසැල අසලින් දිවෙන සභාවේ හිටපු ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාගේ නිවසට යන මාර්ගය සකස් කර ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>විදුලි බල මණ්ඩලය මගින් කපා දමන ලද ගස්වල අතු ඉති මාර්ගයන්හි දමා යාම සිදු නොකරන ලෙසට විදුලි ඉංජිනේරු වෙත ලිපියක් මගින් දන්වා යැවීමට තීරණය විය.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම</u>**

වන අලි ගැටළුව කොතෙක් කතා කළත්, උත්තරයක් සෙවීමට රටක් විදියට මේ වන තෙක් නොහැකි වී ඇත. ඉන් ගොවියන් වන අලීන් විදුලි වැටෙන් එපිටට පලවා හැරීම සඳහා සහාය ලබා දීමට කැමැත්තෙන් සිටින බැවින්, මේ සඳහා අදාළ කටයුතු සිදු කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී. වන අලින් ගම්මානවලට පැමිණීම නිසා එම සතුන්ගේ ජීවිත ද ඇතැම් විට අනාරක්ෂිත වනු ඇත. වන ජීවින් ආරක්ෂා වන්නේ මිනිස් ග්‍රහණයෙන් එපිට සිටීමෙන්ය. එම නිසා ගම් වදින වන අලීන් විදුලි වැටෙන් එපිටට පලවා හැරීම සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

අපගේ පෞරාණික පාරම්පරික නිෂ්පාදන සම්බන්ධයෙන් කතා කිරීමේදී, අපට උරුම සාම්ප්‍රදායික අත්කම් නිර්මාණ රටට අහිමි වීමට ඉඩ පැදී ඇත. වීරවිල තල් ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් තිබේ. ඒ තුළින් අප ප්‍රදේශයට සංචාරකයින් ආකර්ශනය කර ගැනීමට හැකියාව ඇති සම්පතක් ලෙස එය දැක්විය හැකිය. මෙම භූමිය සතුව තිබූ අක්කර 20 ක පමණ ඉඩම් ප්‍රමාණය අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අත්පත් කර ගෙන ඇති බවත්, එහි තවත් භූමි කොටසක් ව්‍යාපාරිකයෙකුගේ වාණිජ කටයුතු සඳහා අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතින බවට කරුණු දැන ගැනීමට ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

අපගේ උරුමයන් වන අපට අවේණික තල් ආශිත්‍ර නිෂ්පාදන දිරිගැන්වීමක් සිදු කර, එම නිෂ්පාදනය වැඩි දියුණු කළ යුතු බැවින්, මේ සම්බන්ධයෙන් දැඩිව සොයා බලා කටයුතු කළ යුතු බවත්, මෙවැනි ව්‍යාපෘති අත්හැර දැමීම සිදු නොකරන, ඊට අදාළ කටයුතු සොයා බලා අපගේ උරුමයන් ආරක්ෂා කර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

රට තුළ පවතින විදුලි අර්බුධය දැඩි ගැටළුකාරී තත්ත්වයකි. මෙවැනි අපහසුතාවන්ට ජනතාවට මුහුණ දීමට සිදුව ඇත්තේ රටේ පවතින ආර්ථික තත්ත්වයේ පහල බෑම බව කිව හැකිය.

ලිට්‍රෝ ගෑස් සමාගමේ සභාපතිට ලක්ෂ 35 ක වැටුපක් සහ ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 04 දෙනෙක් ලබා දී ඇත. එක් නිලධාරියෙකුට මෙවන් විශාල වැටුපක් ගෙවීම සිදු කිරීම තුළින් රටක ආර්ථිකයට සිදු වන බලපෑම පිළිබඳ අවබෝධය පාලකයන්ට තිබියු යුතු බවත්, මෙවැනි ක්‍රියා නවතා දැමීම තුළින් භාණ්ඩාගාරයේ ඇති වන ගැටළු අවම කර ගත හැකි බවත්, මේ පිළිබඳ පාලකයින් දැඩිව සොයා බලා කටයුතු කළ යුතු බවත් සඳහන් කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>**

2022 පෙබරවාරි මස කමිටු සඳහා සහභාගී වීම තමාට ලිපිය ප්‍රමාද වී ලැබීම නිසා, කමිටු සඳහා සහභාගී වීමට නොහැකි වූ බැවින්, ඊළඟ මස සිට කල් ඇතිව කමිටු සඳහා සහභාගී වීමට දන්වන ලිපිය ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

එසේම ‘‘මාගම්පත්තු පුරාණය 01’’ කෘතිය එළිදැක්වීමේ උත්සව සඳහා ද දුරකතනයෙන් තමා වෙත ආරාධනා කරන ලද්දේ, එකී උත්සව අවස්ථාවේදීම නිසා, ඒ සඳහා සහභාගී වීමට නොහැකි විය. එවැනි උත්සව කටයුතු සඳහා ද කල් ඇතිව දැනුම් දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

අප මහා සභාවට පැමිණ යම් යම් යෝජනා, අදහස් දැක්වීම් සිදු කළ පසුව, ඒ සඳහා ගත් ක්‍රියාමාර්ගයන් සහ එහි ප්‍රගතිය අප වෙත දැන්වීම සිදු නොවන බැවින්, අපගේ යෝජනාවන්හි ප්‍රගතිය ඉදිරියේ දී අප වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

තෙල් මාපියාවක් මේ දිනවල සිදු වේ. ඉන්ධන පිරවුම්හල් වල ඉන්ධන තබා ගනිමින් ජනතාව වෙත ලබා නොදීමක් පසුගිය දිනක සිදු නොකරන සිටි අවස්ථාවේදී ගරු සභාපතිතුමාට ඒ පිළිබඳව තමා දැන්වූ පසුව, ඒ සඳහා ක්‍රියාත්මක වී සියලුම දෙනාට ඉන්ධන ලබා ගැනීමට හැකි වන පරිදි ගරු සභාපතිතුමා විසින් වැඩපිළිවෙල සකස් කර දෙන ලදී. ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන ලදී.

උද්ධකන්දර වැවේයාය පී.එම්. ගුණදාස මහතාගේ නිවස අසල සිට මිල්ලත්ත මාර්ගයේ ආරම්භක ස්ථානය දක්වා ඒ.බී.සී. යොදා ඇත. එම මාර්ගය සකස් කර දීමට කටයුතු සිදු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

ළමා අපචාර සම්බන්ධව කතා කිරීමේදී යෝධකණ්ඩිය විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ විසින් සිදු කරන ලද එවැනි ක්‍රියාවක් සඳහා උන්වහන්සේට ලැබුණු දඬුවම දරා ගත නොහැකිව පසුගිය දිනක අපවත් වන ලදී. ස්වාමීන් වහන්සේගේ එම අභාවයට හේතුව වූයේ ප්‍රාදේශීය සභා සභිකයෙකු වන තමා විසින් ස්වාමීන් වහ්නසේට විරුද්ධව පොලිසියේ නඩුවක් දැමූ නිසා බව ප්‍රදේශයේ ජනතාවගේ දෝෂාරෝපණය මා වෙත එල්ල වන ලදී. නමුත් එම කාලයේ ස්වාමීන් වහන්සේ විසින් සිදු කරන ලද වැරදි ක්‍රියාවන් නිසා තමා පොලිසියේ නඩුවක් ගොණු කළ බවත්, එදා තමා එලෙස සිදු නොකලේ නම්, අදටත් අපගේ ළමා පරපුර විනාශ වීමට ඉඩකඩ පවතින බැවින්, අනාගත පරපුර බේරා ගැනීම සඳහා තමා සිදු කළ දේ සඳහා කුමන දෝෂාරෝපණ එල්ල කළත්, තමා එදා නිවැරදි දෙයක් සිදු කළා යැයි මාගේ විශ්වාසය බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අදහස් දැක්වීම</u>**

ග්‍රාමීය මාර්ගවල පවතින බොරලු පාරවල් (කුඹුරු සඳහා ප්‍රවේශවන) බොරලු දමා සකස් කර දීමට කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

කොට්ඨාසයන්හි කුමන හෝ කරුණක් සම්බන්ධයෙන් ගැටළු පැනනැගී ඇත්නම්, ගරු සභිකයින් හරහා දැන්වීමට කටයුතු කලහොත්, ඒ සඳහා අදාළ ආයතන ගෙන්වා සාකච්ඡා කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

මහා සභාවේදී සාකච්ඡා වූ කරුණක් ලෙස, පානීය ජල ගැටළුව සඳහා විසඳුම් ලබා ගැනීම සඳහා 2022.02.22 වන දින මෙම සභාවේදී සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කළ බවත්, මෙකී ගැටළුව සඳහා ඉදිරියේ විසඳුම් ලබා දීමට එහිදී සාකච්ඡා කළ බවත් ප්‍රකාශ කරන ලදී.

පසුගිය දිනක තිස්සමහාරාමයේ ඉන්ධන පිරවුම්හල්වල, ඉන්ධන පුද්ගලයින්ට ලබා නොදී, තබා ගෙන තිබූ අවස්ථාවක තමා විසින් ඒ සම්බන්ධව ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාට සහ ගරු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතුතමා වත දන්වා, ඒ සඳහා ක්‍රියාමර්ග ගෙන තිස්සමහාරාමයේ ජනතාවට ඉන්ධන ලබා ගැනීමට හැකි වන පරිදි වැඩපිළිවෙල සකස් කර දුන් අතර, එය එසේ සිදු කර ගැනීමට හැකි වීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරුන් දෙපලට තම හෘදයාංගම ස්තුතිය පුද කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේ මහතා, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 01.45 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.02.23 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී